ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2017 මාර්තු 27 |

## සේවක අර්ථසාධක අරමුදල විසින් රාජ්‍ය සුරැකුම්පත්වල සිදු කර ඇති ගණුදෙනු පිළිබඳ පරීක්ෂණ වාර්තාවට අදාළව පළ වූ මාධ්‍ය වාර්තා සම්බන්ධ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රකාශය

මෑතකදී පැවැත්වුණු මුදල් මණ්ඩල රැස්වීමෙහිදී සාකච්ඡා වූ කරුණු පිළිබඳව මාධ්‍ය වාර්තා කිහිපයක පළ කර තිබූ සාවද්‍ය කරුණු සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව සිය ස්ථාවරය මෙසේ පැහැදිලි කර සිටී.

සේවක අර්ථසාධක අරමුදල මගින් රාජ්‍ය සුරැකුම්පත්වලට අදාළව සිදු කර තිබූ ගණුදෙනු සම්බන්ධව සිදු කරන ලද පරීක්ෂණයෙන් අනාවරණය වූ කරුණු අනුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම තීරණය කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් එම පරීක්ෂණ වාර්තාව සාකච්ඡාවට ලක් කරන ලදී. යම් වරදක් සිදු කර ඇති බවට සාක්ෂි මගින් පෙනී යන්නේ නම් ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර කාර්යය පටිපාටීන්ට අනුකූලව අදාළ කවර හෝ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කිරීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.